**යටවත්ත ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

යටවත්ත ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට යටවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබියයුතු හා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු කර්මාන්ත අතරැදි රු.138,510 ක් සමාලෝචිත වර්ෂයේ ණයගැති හා ණයහිමි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ජ'නල් සටහන් මගින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල කසළ ගාස්තු රු.273,750 ක් ආදායම් වියදම් ගිණුමේ රු.255,330 ක් ලෙස රු.18,420 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කසළ ගාස්තු සඳහා ලබාදුන් වට්ටම හා බිල්කළ ආදායමෙන් කපා හැරීම් පිළිවෙලින් රු.11,220 ක් හා රු.7,200 ක් ආදායම් වියදම් ගිණුමේ දක්වා නොතිබුණි. | -එම- | -එම- |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 122(1) වගන්තිය | ප්‍රාදේශීය සභා මාර්ග පිළිබඳ අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාව කෙටුම්පත් කර ඉදිරි කටයුතු සඳහා පළාත් පාලන පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 102(1) වගන්තිය සහ ගෝඝාතක ආඥා පනතේ 4(1) වගන්තිය | බලපත්‍රයක් ලබා නොගෙන මැදියාපොල ප්‍රදේශයේ පෞද්ගලික ස්ථානයක ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යන බවත් එම ගෝඝාතකාගාරයේ ගව මස් අලෙවිසැළ සඳහා වෙළඳ බලපත්‍රයක් නිකුත් කර තිබුණු බවත් නිරීක්ෂණය විය. | ඉදිරියේදී 1893 අංක 09 දරන ගෝඝාතක ආඥා පනතේ 4(1) වගන්තියේ විධිවිධාන පරිදි බලපත්‍රයක් ලබා දීමට කටයුතු සිදු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) 1946 අංක 57 දරන පොදු සුසාන භූමි සහ පෞද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනත 5(1) වගන්තිය | සභාව සතුව පවතින සුසාන භූමි 43 ක අයිතිය පවරාගෙන ගැසට් පත්‍රයේ පළකර ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි | පොදු හා පුද්ගලික සුසාන භූමි ආඥා පනත යටතේ මළවුන් වැළලීම හා ආදාහනය සඳහා වෙන් වූ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා අදාළ ලේඛන සමඟ ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති බව. | අයිතිය පවරාගෙන ගැසට් පත්‍රයේ පළකල යුතුය. |
| (ඇ) 2016 පෙබරවාරි 23 දිනැති අංක 1955/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා ) පනත | | | |
| (i) පීඩාකාරි හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යාවස්ථාවේ 04 වන වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද සමීක්ෂණයට අනුව පීඩාකාරි හා අන්තරාදායක ව්‍යාපාර ආයතන 275 න් සභාවට ලැබිය යුතු බලපත්‍ර ආදායම රු.202,250 ක් අයකරගෙන නොතිබුණි. | ජංගම සේවා ක්‍රියාත්මක කරමින් වෙළඳ බලපත්‍ර ලබා දීමට කටයුතු සිදුකර ඇති බව. | අතුරු ව්‍යාවස්ථාවේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 4(i) වගන්තිය | සභා බලප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබියයුතු ස්ථාන සහ එක් එක් ස්ථානයේ නවතා තැබියයුතු උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව මහා සභාව මඟින් තීරණය කර එය ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කළයුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව | අතුරු ව්‍යාවස්ථාවේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,670,551 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,909,058 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල්කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,503,429 | 1,475,569 | 1,475,569 | - | 1,634,360 | 1,577,010 | 1,577,010 | - |
| (ii) | කුලී | 1,219,554 | 1,048,506 | 1,048,506 | 31,000 | 997,125 | 619,214 | 619,214 | 31,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 687,030 | 677,750 | 652,030 | 9,000 | 695,860 | 644,860 | 645,860 | 16,000 |
| (iv) | වෙනත් ආදායම් | 19,851,957 | 24,680,834 | 26,221,123 | 13,871,393 | 17,204,461 | 20,093,805 | 20,673,576 | 14,194,774 |
| | එකතුව | 23,261,970 | 27,882,659 | 29,397,228 | 13,911,393 | 20,531,806 | 22,934,889 | 23,515,660 | 14,241,774 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ජල ගාස්තු** | | |
| ජල මෝටරය අක්‍රීය වීම හේතුවෙන් 2022 මැයි මස සිට බිල් කිරීම් නවතා දමා තිබුණු මැදියාපොළ ජල ව්‍යාපෘතියේ හිඟ ජල ගාස්තු රු.118,480 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ජල ගාස්තු අය කර ගැනීම සඳහා ජංගම සේවා හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇති බව. | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| **(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.591,308 ක් හා මුද්දර ගාස්තු රු.11,999,077 ක් විය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනිමට කටයුතු කල යුතුය. |

**2.3 අධිභාර**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂවල පැනවූ අධිභාර 2022 දෙසැම්බර් 31 දිනට රු.32,259 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | අයකර ගැනිමට කටයුතු කරමින් පවතින බව. | අධිභාර අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මහජන සෞඛ්‍ය | | |
| 2020 වර්ෂයේ සිදුකර තිබුණු ජල සාම්පල් පරීක්ෂාවන්ට අනුව ජල මූලාශ්‍ර 5 ක ජලය බීමට නුසුදුසු බව දන්වා තිබියදී පිරිපහදු කර නැවත ජල සාම්පල් පරීක්ෂා කිරීමකින් තොරව පානීය ජලය බෙදා හැර තිබුණි. | අමුද්‍රව්‍ය හිඟයක් පවතින බැවින් අමුද්‍රව්‍ය ලද වහාම ජල සාම්පල් පරීක්ෂාව සිදු කරන බව. | ජල සාම්පල් පරීක්ෂා කර පිරිසිදු පානීය ජලය නිකුත් කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම | | |
| | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශයේ ආදාහනාගාරය පොදු වැසිකිළි , සති පොලක් හා පොදු වෙළඳපලක් වැනි පොදු පහසුකම් සපයා නොතිබීම හේතුවෙන් පනතේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | අඩුපාඩු ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | |
| | සභා බලප්‍රදේශය තුළ මාසිකව කසළ ටොන් 15 ක් පමණ එකතුවන අතර ඉන් දිරන කසළ , කසළ අංගනයේ වලකට බැහැර කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මාර්තු 22 දින සියයට 50 දායකත්ව පදනම මත රු.1,048,896 ක් වටිනා කැබලි කරන යන්ත්‍රයක් හා රු.508,896 ක හලන යන්ත්‍රයක් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයෙන් කොම්පෝස්ට් පොහොර නිපදවීමේ කටයුතු සඳහා ලබාගෙන තිබුණ ද කැබලි කරන යන්ත්‍රයේ ධාරිතාවය ප්‍රමාණවත් නොවන බව පවසා අදාල යන්ත්‍රය භාවිතයෙන් තොරව පැවතුණි. | අඩුපාඩු ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරන බව. | සක්‍යතා අධ්‍යනයක් සිදු කර ධාරිතාවය හඳුනා ගෙන මිල දී ගැනීම් සිදු කල යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යටවත්ත ප්‍රාදේශීය සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ 52 ක් සඳහා වැටුප් පිළියෙල කිරිම සඳහා GPS පරිගණක මෘදුකාංගය භාවිතා කර නොතිබුණි. | ඉදිරියේදී GPS පරිඝනක මෘදුකාංගය මඟින් වැටුප් සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව | වැටුප් සැකසීම සඳහා වැටුප් පරිඝනක මෘදුකාංග යොදා ගතයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 4 ක එකතුව රු.15,110,565 ක් විය. | කඩිනමින් අයකර ගැනිමට කටයුතු කරන බව. | ලැබියයුතු මුදල් අයකල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති ගෙවිය යුතු වසර 1 ත් වසර 5ත් අතර කාල පරාසයක කර්මාන්ත ණයහිමි ශේෂවල එකතුව රු.999,787 ක් විය. | ඉදිරියේදි ගෙවිමට කටයුතු කරන බව. | ගෙවියයුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | 2016 පෙබරවාරි 23 දිනැති අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකළ පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ ප්‍රාදේශීය සීමාව තුළ ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා වූ සැළැස්ම පරීක්ෂා කිරිම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යාවස්ථාවේ 12 වැනි වගන්තිය ප්‍රකාරව කවුඩුපැලැල්ල ගලහිටියාව වලව්වත්ත ඉඩමෙන් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා පර්චස් 17.92 ක ඉඩම් කොටසක් හා රතලවැව වතුයායවත්ත ඉඩමත් (වින්රෝයි ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්) | භූමි ප්‍රමාණය ලබා ගැනීමට හා සභාව වෙත අයවිය යුතු මුදල කඩිනමින් අයකර ගැනිමට කටයුතු කරන බව. | භූමි ප්‍රමාණය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

පර්චස් 37.56 ක ඉඩම් කොටස පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ විවිධ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන අක්කර 6 පර්චස් 36.65 ක ඩන්ගන් වත්ත ඉඩමේ ඔප්පු හෝ පැවරුම් නියෝග ලබාගෙන නොතිබුණු අතර, එකතුව රු.3,750 ක ඉඩම් කොටස් 8 ක අයිතිය පවරාගෙන ද නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සභාව විසින් ඉකුත් වර්ෂයේ සිදුකරන ලද ස්ථාවර වත්කම් සමීක්ෂණය අනුව සභාවට අයත් පර්චස් 29.1 ක ඉඩම් කොටස් 3 ක් බාහිර පාර්ශවයන් විසින් අත්පත් කරගෙන තිබුණද, එම ඉඩම් කොටස් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | නිරවුල් කිරීමේ හා මිණුම් කිරීමේ කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව. | අනවසර පදිංචිකරුවන් ඉවත් කර ඉඩම්වල ආරක්ෂාව තහවුරු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතික තොග පරීක්ෂාව අනුව, ජල උපාංග 5 ක එකතුව රු. 23,118 ක ඌනතාවයක් පැවතිණි. | ඌනතාවයන් සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන් වෙතින් අය කර ගැනීමට කටයුතු සිදු කරන බව. | වගකිව යුතු පාර්ශවයන් වෙතින් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **යාපා මහතාගේ නිවස ඉදිරිපිට දෙළං ඇල මාර්ගය සංවර්ධනය කිරීම** | | |
| රු. 295,917 ක පිරිවැයක් දරා ඉදිකර තිබූ ඉහත සඳහන් මාර්ගයට නිසි පරිදි කාණු පද්ධතියක් සැළසුම් නොකිරීම හා උරගිස් නිසි පරිදි සැකසීමට ඇස්තමේන්තු ප්‍රතිපාදන සළසා නොතිබීම නිසා , මෙම මාර්ගය වැසි ජලය සමඟින් සෝදා පාළුවට ලක්වී තිබුණි. | මාර්ගයේ කොන්ක්‍රිට් තට්ටුව ඇතුළතින් පස සෝදා පාළුව වැළැක්වීම සඳහා කටයුතු කර ඇති බව. | මාර්ගයේ පැවැත්මට අදාල ඉදිකිරීම් ඇස්තමේන්තු කර නිම කිරීමට කටයුතු කළයුතුය . |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව සැසඳීමේදී තනතුරු 5 ක සේවක පුරප්පාඩු 5 ක් පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කල යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**
**තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම සඳහා වැය විෂයයන් 21 ක් සඳහා රු.4,250,085 ක ප්‍රතිපාදන සළසා දී තිබුණද, ඉන් වැය විෂයයන් 7 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු. 67,205 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරිකර තිබුණු අතර, වැය විෂයයන් 14 ක් සඳහා වෙන්කළ රු.4,182,880 ක ප්‍රතිපාදනවලින් රු.3,518,739 ක් වූ සියයට 84 ක් ඉතිරිකර තිරසර සංවර්ධන ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇස්තමේන්තුගත කළ ප්‍රමාණයටම වැය කිරීමේ හැකියාවක් නොවූ බව | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළයුතුය. |